(12)

පීඨාධිපති කාර්යාලය — OFFICE OF THE DEAN
සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය — Faculty of Social Sciences & Humanities
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය — Rajarata University of Sri Lanka

ඔබේ අංකය. :
Your Ref.

මගේ අංකය :
My Ref. : RJT/SSH/Dean/2024

දිනය
Date : 2024.02.06

19 FEB 2024

2024/02/19

ප්‍රධාන ලේකම් තුමා
දකුණු පළාත් සභාව
දිගානායක මාවත
ගාල්ල.

හිතවත් මහත්මයාණනි / මහත්මියණි,

පරිසර කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ඉල්ලුම් පත් කැඳවීම (සිව්වන කණ්ඩායම - 2024)

01. ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨයේ පරිසර කළමනාකරණ අධ්‍යානාංශය මගින් පවත්වාගෙන යනු ලබන පරිසර කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාවේ සිව්වන කණ්ඩායම සඳහා සිසුන් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවා ඇත.

02. පරිසර පද්ධතියේ සේවාවන් ආරක්ෂා කර ගනිමින් මානව කටයුතු හැඩගස්වා ගැනීම කාලීන අවශ්‍යතාවයක් වී තිබේ. ඒ අනුව පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය පිළිබඳ දැනුම රාජ්‍ය අංශයේ නිලධාරීන් වෙත ලබා දීම මෙම පාඨමාලාවේ එක් ප්‍රධාන අරමුණක් වේ.

03. මෙම පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන ඔබ අමාත්‍යාංශයේ/දෙපාර්තුමේන්තුවේ/ආයතනයේ හෝ ඔබ යටතේ පවතින වෙනත් ආයතනවල සේවය කරන නිලධාරීන් මේ සම්බන්ධව දැනුවත් කරන ලෙස කාරුණිකව ඉල්ලමි. පාඨමාලාව සඳහා ඉල්ලුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් හා අනෙකුත් විස්තර ඇතුලත් පත්‍රිකාවක් මේ සමඟ අමුණා ඇත.

04. පාඨමාලාව පිළිබඳ වැඩි විස්තර දැනගැනීමට අවශ්‍ය වේ නම් පාඨමාලා සමායෝජක සම්බන්ධ කර ගන්නා ලෙස ඉල්ලා සිටිමි.

පාඨමාලා සමායෝජක - ආචාර්ය ඩබ්ලිව්.එම්.එස්.බී වන්නිනායක මහතා

071-8159069 / 0252266268

05. මෙම කාර්යය සාර්ථක කරගැනීම සඳහා ඔබ ලබාදෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

ස්තූතියි

මහාචාර්ය ඩී. තුසිත මැන්දිස්
පීඨාධිපති
සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය

මිහින්තලේ, ශ්‍රී ලංකා Mihintale, Sri Lanka 025-2266788, E-Mail: dean@ssh.rjt.ac.lk Fax : 025-2266788

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
පාරිසරික කළමනාකරණ අධ්‍යයන අංශය
සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය

# පාරිසරික කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව - සිව්වැනි කණ්ඩායම 2024

# The Diploma in Environmental Management - Intake IV 2024

**අරමුණ :** තිරසාර සංවර්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා ආයතන නිළධාරීන් තුළ තිබිය යුතු පාරිසරික කළමනාකරණ දැනුම, කුසලතා සහ ආකල්ප ඇති කිරීම.

**ඉලක්ක කණ්ඩායම :**

- සියලුම රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ රැකියාවල නිරත වූවන්
- තිරසාර සංවර්ධනය සඳහා පරිසරය ආරක්ෂා කිරීමට සහ පාරිසරික කළමනාකරණය හැදෑරීමට කැමැත්තක් දක්වන අය

**ඇතුළත් වීමේ සුදුසුකම් :**

- අ. පො. ස. (උසස් පෙළ) විෂයන් තුනකින් සමත් වීම;

**හෝ**

- ජාතික වෘත්තිය පුහුණු 4 වන අදියර (NVQ Level 4) සමත් වීම;

**හෝ**

- අධ්‍යයන මණ්ඩලය විසින් සලකා බලා විශ්වවිද්‍යාල සනාතන සභාව විසින් පිළිගත හැකි වෙනත් සුදුසුකමක් ලබා තිබීම;

**සහ**

- ලිඛිත පරීක්ෂණයෙන් හෝ සම්මුඛ පරීක්ෂණයෙන් සමත් වීම.

**පාඨමාලා කාලය** : අවුරුදු එකයි (01) (සමාසික දෙකයි) - සති අන්ත සෙනසුරාදා දිනවල පෙ.ව. 8.30 සිට ප.ව. 4.30 දක්වා

**පාඨමාලා මාධ්‍යය** : සිංහල

**දේශන ක්‍රමවේදය** : දුරස්ථ සංනිවේදන (zoom)

**සම්පූර්ණ පාඨමාලා ගාස්තුව** : රු. 54,000/= (සමාන වාරික දෙකකින් ගෙවා නිම කළ හැකිය)

(පාඨමාලා ගාස්තුව රු. 53,000/= , ලියාපදිංචි ගාස්තු රු. 1000/=)

**ආරම්භය** : 2024 මැයි පළමු සතිය

**අයදුම්පත්** : ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, ලංකා බැංකුව (මිහින්තලේ) පවත්වාගෙන යනු ලබන ගිණුම් අංක 5022233 දරන ගිණුමට රු. 500/= ක මුදලක් ගෙවා එම රිසිට් පත සමඟ (චෙක්පත් භාර ගනු නොලැබේ) අයදුම්පත්‍රය ඔබගේ ලිපිනය ලියූ මුද්දර (9x4) කවරයක්, සහකාර ලේඛකාධිකාරි, දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ යන ලිපිනයට 2024 මාර්තු 01 දිනට පෙර එවියයුතුය. අයදුම් පත් ආකෘතිය විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් අවපතනය (Download) කර ගත හැකිය.

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය : 2024 මාර්තු 01

- විමසීම් : පාඨමාලා සමායෝජක 0718159069 / 0252266268
- වෙබ් අඩවිය : http://www.rjt.ac.lk

ලේඛකාධිකාරි ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය මිහින්තලේ

2024-02-01